www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපද-චීන සංවාදය බිඳෙන සුලු සහවාසයකි

## US-China talks: a fragile relationship

**ජෝන් චැන් විසිනි**
**2009 ජුලි 30**

ජුලි 27-28 දෙදින තුල වොෂින්ටනයේ පැවති එක්සත් ජනපද-චීන මූලෝපායික හා ආර්ථික සංවාදය, නයගැතිකමේ ගිලී ඇති එක්සත් ජනපද ධනවාදය, ප්‍රමුඛ නය සැපයුම්කරුවෙකු ලෙස චීනය මත රැඳී සිටින තරම පෙන්නුම් කරයි. ඒ සමග ම, දෙරටේ එන්ට එන්ටම වැඩිවන විසංවාදී මූලෝපායික හා ආර්ථික ආසක්තයන් ද සංසදය එලිමහනට ගෙන ආවේය.

හිටපු භාන්ඩාගාර ලේකම් හෙන්රි පෝල්සන් යටතේ බීජිං තන්ත්‍රය සමග මූල්‍ය ප්‍රශ්න සාකච්ඡා කිරීම පිනිස බුෂ් පාලනාධිකාරය විසින් පලමුවෙන් පිහිටුවන ලද මෙම හමුවේ න්‍යාය පත්‍රය, ඔබාමා පරිපාලනය විසින් රාජ්‍ය දෙපාර්තමේන්තුව මෙන්ම චීන-එක්සත් ජනපද සම්බන්ධතා මත දැඩි ලෙස එල්බ පවතින මූලෝපායික ප්‍රශ්න ද ඇතුලත් වන පරිදි යාවත්කාලීන කර තිබේ.

ගැඹුරු වන ගෝලීය ආර්ථික අර්බුදය මධ්‍යයේ අප්‍රේල් මාසයේ ලංඩන් හි පැවති ජී20 නායක සමුලුවේ දී, එක්සත් ජනපද ජනාධිපති බරක් ඔබාමා හා චීන ජනාධිපති හූ ජින්ටාවෝ සංවාදය පැවැත්වීම ගැන එකඟත්වයකට පැමිනියහ. මෙම වසරේ දී ඩොලර් ට්‍රිලියන 1.85 ක් දක්වා ඉහල යන අයවැය හිඟය පියවාගැනීමේ දී ඔබාමා පරිපාලනයට, දැන් ඇමරිකාවේ විශාලතම නය සැපයුම්කරු වන චීනය, නැතුව ම බැරිය. ඩොලර් බිලියන 800 ක භාන්ඩාගාර බිල්පත් ද තවත් බිලියන සිය ගනනක ආන්ඩුවේ බැඳුම්කර ද සතු කර ගෙන සිටින චීනය, වෝල් වීදිය ගලවා ගැනීමේ දැවැන්ත ඇප බැඳීම් සඳහා මුදල් සැපයෙන මූලාශ්‍රය වෙයි. මෙම සතිය තුල පමනක් ඇමරිකානු ආන්ඩුව ඩොලර් බිලියන 200 ක් වටිනා බැඳුම්කර නිකුත් කලේය.

වැඩිවන විරැකියාව සමග පොරබදමින් සිටින බීජිං තන්ත්‍රයට, චීනයේ රෝගීව ඇති අපනයන අංශය සඳහා ප්‍රධාන වෙලඳපොල වන ඇමරිකාවේ ඉල්ලුම, යලි සඵල කර ගැනීම මග නොහැරිය හැකි අවශ්‍යතාවකි. ගෝලීය ප්‍රාග්ධනය සඳහා චීන කම්කරු පන්තියේ ලාභ ශ්‍රමය සූරාකෑම මගින් නිර්මානය කර තිබෙන ගැඹුරු සමාජ ආතතීන් පෙන්නුම් කරමින්, දොට්ටදැමීම් වලට හා පුද්ගලීකරනයට එරෙහිව කැරලිකාරී වූ 30,000 වානේ කම්කරුවෝ, පසුගිය සතියේ වයඹ දිග ජිලින් ප්‍රාන්තයේ පැවැත්වූ විරෝධතාවක දී සිය කලමනාකරු මරා දැමූහ.

එක්සත් ජනපද පාර්ශවයේ නායකත්වය දැරුවේ, ෆෙඩරල් මහ බැංකු සභාපති බෙන් බර්නන්කේ සමග රාජ්‍ය ලේකම් හිලරි ක්ලින්ටන් හා භාන්ඩාගාර ලේකම් තිමොති ගේත්නර් විසිනි. බීජිනය, විදේශ ප්‍රතිපත්ති පිලිබඳ රාජ්‍ය නියෝජිත දායි බින්ගුවෝ, ආර්ථික අධීක්ෂනය භාර, උප අගමැති වැන්ග් කුයිෂාන් හා මධ්‍යම බැංකු අධිපති සෝවු සියාවුආන් ගේ නායකත්වයෙන් යුත්, ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 150 ක ගෙන් සමන්විත පෙරනොවූ විරූ තරමේ විශාල නියෝජිත කන්ඩායමක් වොෂින්ටනය වෙත පිටත්කර හැරීය.

එක්සත් ජනපදය ඉහල පෙලේ නියෝජිත කන්ඩායමක් සාකච්ඡාව සඳහා සම්බන්ධ කල අතර චීන නියෝජිතයන් කිසිවෙකුත්, අතිශය බලවත් චීන කොමියුනිස්ට් පක්ෂ (සීසීපී) ස්ථාවර දේශපාලන කමිටුවේ සාමාජිකයෙකු නොවීය.

එක්සත් ජනපද-චීන සම්බන්ධතා "21 වන සියවස හැඩගස්වනු" ඇතැයි කියා සිටිමින් ජනාධිපති ඔබාමා මෙම සැසිය විවෘත කලේය. එක්සත් ජනපදයේ අධිකාරයට චීනය අභියෝග කරනු ඇතැයි යන අදහස බැහැර කිරීමට උත්සාහ කරමින් ඔබාමා මෙසේ ප්‍රකාශ කලේය. "චීනයේ සමහරු සිතන්නේ අප චීනයේ අභිලාශයන් අත්අඩංගුවට ගැනීමට උත්සාහ කරන බවයි. ඇමරිකාවේ සමහරුන් සිතන්නේ නැගී එන චීනයේ බියකරු යමක් තිබෙන බවයි. මම වෙනස් මතයක් දරන්නෙමි. මම විශ්වාස කරන්නේ අප ජාතීන්, අවශ්‍යතාවෙන් තොර හා අවස්ථාවෙන් ද තොර කොටස්කරුවන් වන අනාගතයක් ගැනයි."

ක්ලින්ටන් හා ගේත්නර් වෝල් ස්ට්‍රීට් ජර්නලයේ කුඩා සටහනක් තබමින් ප්‍රකාශ කලේ "සරලව කිවහොත් ගෝලීය ගැටලු කිහිපයක් එක්සත් ජනපදයට හෝ චීනයට තනිව ම විසඳගත හැකිය. එක්සත් ජනපදය හා චීනය සම්බන්ධ නොවී කිහිපයක් විසඳගත හැකිය.

ගෝලීය ආර්ථිකයේ ශක්තිය, ගෝලීය පරිසරයේ නිරෝගීකම, අඩමාන රාජ්‍යයන් ස්ථාවර වීම හා අවි තරඟය පිලිබඳ අභියෝග, එක්සත් ජනපදය හා චීනය අතර සහයෝගය අවශ්‍ය කෙරෙන විශාල ප්‍රශ්න වේ." යනුවෙනි.

ක්ලින්ටන් පෙබරවාරි මාසයේ දී චීනයේ සංචාරය කල අතර, එක්සත් ජනපද රාජ්‍ය ලේකම් වරයෙක් ඊට පෙර නොගත් ආකාරයේ පියවරක් ගනිමින්, එක්සත් ජනපද ආන්ඩුවේ බැඳුම්කර දිගටම මිලට ගන්නා ලෙස බීජිනයෙන් ඉල්ලා සිටියාය. ජූනි මාසයේ දී ගේත්නර් බීජිනයට පැමින, අයවැය හිඟය අඩුකිරීම සඳහා දැඩි සීමා පැනවීමේ පියවර ගැනීම මඟින් ධවල මන්දිරයේ ඔබාමා පාලනය, චීනයේ දැවැන්ත බැඳුම්කර සංචිතවල ආරක්ෂාව සලසන බව, චීන නායකයින්ට සහතික කලේය.

ජනවාරියේ සිය පලමු නිල ප්‍රකාශනයෙන් ගේත්නර් තර්ජනය කර තිබුනේ, චීනය සමඟ සිදුවන එක්සත් ජනපද වෙලඳමේ දැවැන්ත හිඟය ගැඹුරු කිරීමට තුඩුදෙන පරිදි අපනයන නැංවීම සඳහා චීනය සිය යුවාන් මුදල කෘතීම ලෙස අව අගයක පවත්වාගෙන යන බවට එල්ල වී ඇති චෝදනා මත නව පරිපාලනය, චීනය "මූල්‍ය උප්පරවැට්ටිකාරයෙකු" ලෙස නම්කරනු ඇති බවටය. මෙම සතියේ රැස්වීම තුල ගේත්නර් ඒ මාතෘකාව පිලිබඳව නිහඬව පසු විය. එක්සත් ජනපද වෙලඳ මන්ඩලයේ උප සභාපති මයිරන්ට් බ්‍රිලියන්ට්ගේ වචන වලට අනුව "මෙය පරිපාලනය මේසයට තඩිබාන ප්‍රශ්නයක් බවට පත්වී නැත."

සිය පාර්ශවයෙන් චීන නිලධාරීහු, එක්සත් ජනපද ඩොලරය ගෝලීය සංචිත මුදලක් මඟින් විස්ථාපනය කල යුතුය යන ඔවුන්ගේ පෙර ප්‍රකාශ ගැන නිහඬව සිටියහ. චීන මධ්‍යම බැංකු ප්‍රධානී ෂෝඋ කියා සිටියේ ගේත්නර් සමඟ රැස්වීමේ දී නව ජත්‍යාන්තර සංචිත මුදලක් ගැන සාකච්ඡා නොකෙරුනු අතර චීනයේ පාලිත හුවමාරු මුදල ගැන "යන්තම් සඳහන් කෙරුනා" පමනක් බවය.

එසේ වුවත්, එක්සත් ජනපදයේ වැඩිවන හිඟය චීනයේ ඩොලර් පදනම් කරගත් දැවැන්ත වත්කම් වලට වලකපනු ඇතැයි යන භීතිය හමුවේ උප අගමැති වැන්, ඩොලරයේ අගය ආරක්ෂා කර ගන්නා ලෙසට කරන බීජිනයේ ඉල්ලීම යලිත් සිහිගැන්වීය. ට්‍රිලියන දෙකකටත් වඩා වැඩි වන චීනයේ විදේශ මුදල් සංචිත වලින් තුනෙන් දෙකක් තබා ඇත්තේ ඩොලර් වලිනි. මෙයට පිලිතුරු වශයෙන් ගේත්නර් මෙසේ පල කලේය. "චීනය කරනු ඇති පරිදි එක්සත් ජනපදයේ අපි, මධ්‍ය කාලීනව මූල්‍ය හිඟය පහත හෙලීමේ පියවර ගනිමින් සිටින්නෙමු. අර්බුදය සමථයකට පත්කිරීම සඳහා අප විසින් ගත යුතුව ඇති සුවිශේෂී පියවර ආපසු හැරවීමට ද අපි වැඩ කරන්නෙමු."

බුෂ් හා ඉන් පසුව ඔබාමා පරිපාලනය විසින් වෝල් වීදියට ඇප දීම සඳහා දරනු ලැබූ බහු ට්‍රිලියන වියදමේ අරමුන වූයේ, දැවැන්ත මූල්‍ය අලාභයන් ඇමරිකානු කම්කරු පන්තියේ කරමතට පාත් කිරීමය. එයින් අර්ථවත් වූයේ, සෞඛ්‍ය හා අධ්‍යාපන පහසුකම් වැනි අත්‍යාවශ්‍ය සමාජ සේවාවන් විනාශ කිරීම මෙන්ම, මූර්ත වැටුප් තවදුරටත් පහත හෙලීම ය. සීමා පැනවීම් තුලින් එක්සත් ජනපද හිඟය "පහත හෙලන" බවට බීජිනට දුන් ගේත්නර්ගේ සහතිකයේ සාරය එහි අඩංගු වෙයි.

කෙසේ වෙතත් ඇමරිකානු කම්කරුවන්ගේ පහත වැටෙන පරිභෝජනය, චීනය පමනක් නොව අනෙකුත් ආසියානු ආර්ථිකයන් ද ගැඹුරු අර්බුදයකට හෙලනු ඇත. එක්සත් ජනපද පිලිවෙත නයෙන් දුවන පරිභෝජනය කෙරෙන්, ඉතිරිකිරීම් වැඩි කිරීම කරා මාරු කෙරෙන අතර, ගේත්නර් චීනයට කියා සිටියේ "සමතුලිත හා තිරසාර ගෝලීය වර්ධනයක්" සඳහා වඩාත් දේශීය යොමුවක් සහිත වර්ධනයකට මාරු වන ලෙසයි. ඊනියා ආර්ථික ප්‍රති තුලනය තුල එක්සත් ජනපදයේ පරිභෝජනය හැකිලවීම, නොසංසුන්තාවය සමනය කර ගැනීමේ අදිටනින් මිලියන් ගනනින් රැකියා නිර්මානය කරන නිෂ්පාදනයේ පුලුල් වීමක හදිසි අවශ්‍යතාවක් සහිත බීජිනය සමඟ තියුනු ගැටුමකට යනු ඇත.

චීනයේ යෝධ උත්තේජක වැඩ සටහන් ගැන සඳහන් කරමින් පීකිං විශ්වවිද්‍යාලයේ මහාචාර්ය මයිකල් පෙටිස් අනතුරු ඇඟවීමක් ලෙස *වෝල් ස්ට්‍රීට් ජර්නලයට* පැවසුවේ "චීනය, යන්තම් සය මසක් ඇතුලත පසුගිය වසරේ දල දේශීය නිෂ්පාදිතයෙන් හතරෙන් එකකටත් වඩා ප්‍රමානයක අලුත් නය, පද්ධතිය තුලට වැක්කිරීම තුලින්, කෙටිකාලීනව රැකියා නිර්මානය වන බව සත්‍යයක් නමුත්, එය අතිරේක අධි ධාරිතාවය වැඩිවීමට හා ආන්ඩුවේ ශේෂ පත්‍රය පිරිහෙලීමට තුඩුදෙනු ඇත. චීනය තුල ආන්ඩුවේ පෙලඹවීම් සහිත නිෂ්පාදනය ඉහල නැගීමක් සමඟ, එක්සත් ජනපදය තුල ඉතිරි කිරීම් ඉහල නැගීම ගැටුමකට හැරීම, දෙරට ම එකිනෙකාට විනාශකාරී පිලිවෙත් තුලට තල්ලු කිරීමක් වනු ඇත. එවැන්නක ප්‍රතිවිපාක විශේෂයෙන්ම චීනයට, අති දරුනු විය හැක".

බීජිං තන්ත්‍රය සමාජ කාල බෝම්බයක් මත හිඳින බව දන්නා ඔබාමා පරිපාලනය, ෂිංජියෑන්හි උයිගුර් කලාපයෙහි පෙරලිකාරිත්වය මැඩීමේ චීන මිලිටරි කාවැදීම් පිලිබඳව බොහෝ දුරට නිහඬතාවක් පල කොට තිබේ. ධවල මන්දිරය අවට දුසිම් ගනනක් උයිගුර් ක්‍රියාකාරීන් "චීනයට ලැජ්ජාව" යන සටන් පාඨ හඬනගද්දී චීන උප විදේශ ඇමති වැන් ගුවන්යා ප්‍රකාශ කලේ, ෂින්ජියෑන් කැලඹීම පිලිබඳව "එක්සත් ජනපදයේ මධ්‍යස්ථ ආකල්පය ගැන අපගේ ප්‍රශංසාව හිමිවන"

බවයි. ඔහු වාර්තාකරුවන්ට පැවසුවේ වොෂින්ටනය "මෙම සිදුවීම තනිකර ම චීනයේ අභ්‍යන්තර ප්‍රශ්නයක් බව නොපැකිලව ප්‍රකාශ කල'' බවයි.

ඇමරිකානු ධනවාදය, චීන කම්කරු පන්තියේ ලාභ ශ්‍රමය මෘග ලෙස සූරාකෑම මත රැඳී සිටිනවා පමනක් නොව, කම්කරු පන්තියට එල්ල කරන දරුනු සමාජ ප්‍රහාරයන්ගේ ප්‍රතිපලයක් ලෙස එක්සත් ජනපදය තුලම මහා පරිමානයේ සමාජ නොසංසුන්තා හටගැනීම, කාලය පිලිබඳ ප්‍රශ්නයක් පමනක් බව ද, ඔබාමා පරිපාලනය හොඳකාරව ම දැන සිටියි.

එක්සත් ජනපද-චීන සංවාදය සලකුනු කලේ ඇමරිකානු ධනවාදයේ ඓතිහාසික පරිහානියයි. ර ස්වීම සැලසුම් කර තිබුනේ එක්සත් ජනපදය අධිකාරය දරන ලෝක පර්යායක කූඩය තුලට චීනය ද ඇදගැනීමේ අටියෙන්, එරටට යම් සහන පිරිනැමීම සඳහා ය. ඔබාමාගේ විදෙස් පිලිවෙත සැකසීමේ දී මූලික භූමිකාවක් ඉටුකල ස්බිග්නිව් බ්‍රෙසසින්ස්කි විසින් ජනවාරි මාසයේ බීජිංහි දී, එවන් මූලෝපායක් ප්‍රථම වරට යෝජනා කලේය. හිටපු එක්සත් ජනපද ජනාධිපති ජිමී කාටර්, රාජ්‍ය ලේකම් හෙන්රි කීසිංජර් හා චීන ජනාධිපති හූ ජින්ටාවෝ හා අගමැති වෙන් ජියා බාවෝ ඉදිරියේ බ්‍රෙසසින්ස්කි සිය කථාව පැවැත්වීය.

ඔහුගේ කථාව, "ලෝකය වෙනස්කල හැකි දෙදෙනාගේ කන්ඩායම" යන ශීර්ෂය යටතේ ජනවාරි 13 වන දින *ෆිනෑන්ෂල් ටයිම්ස්* පත්‍රයේ පලකොට තිබුනි. ඔහු මෙසේ පැවසීය.

ගෝලීයව නැඟී එන චීනය සංශෝධනවාදී බලයක් වන අතර, ජාත්‍යන්තර පද්ධතිය තුල වැදගත් වෙනස්කම් සඳහා එය කැමැත්තක් දක්වන නමුත්, චීනය එය බලාපොරොත්තු වන්නේ සංයමයකින් යුතුව විචක්ෂන හා සාමකාමී රටාවකටය. ඉරානය පිලිබඳව එක්සත් ජනපදයේ කටයුතු වලට චීනයේ සහභාගීත්වය ද ඇතුලු, ආර්ථික අර්බුදයට එහා යන පුලුල් සහයෝගිතාවක් සඳහා බ්‍රෙසසින්ස්කි, කැඳවුම් කලේය. ඉන්දියානු-පකිස්ථාන සම්බන්ධතා හා ඊස්රායල්-පලස්තීන ගැටුම ද පොදුවේ මැද පෙරදිග ද චීනයේ භූමිකාව පිලිබඳව එක්සත් ජනපද -චීන උපදේශනය කෙරෙහි ද ඔහු අවධානය යොමු කලේය. "යුරෝපය හා ජපානය සමග අපගේ සම්බන්ධතාවන්ට සමාන්තරව යන" පරිදි චීනය සමඟ ද හවුලක් ඔහු කොන්දේසියක් ලෙස ඉදිරිපත් කලේය.

කෙසේ වුව ද ජී2 සංකල්පය, ලෝක කටයුතුවල දී චීනයට, තමන්ගේ වියදමෙන් බලගතු භූමිකාවක් සඳහා ඉඩ සලසාදෙනු ඇතැයි යන කනස්සල්ල යුරෝපය හා ජපානය තුලින් මතුව ආවේය. එක්සත් ජනපද-චීන සාකච්ඡා පිලිබඳව සිය කථාවේ දී ඔබාමා, එක්සත් ජනපද-චීන සබඳතා ''ලෝකයේ ඇති ඕනෑම ද්වි පාක්ෂික සබඳතාවක් තරම්ම වැදගත් වන" බව කැපී පෙනෙන ලෙසට ප්‍රකාශ කලේය. එය, දෙවන ලෝක සංග්‍රාමයේ පටන් ආසියාවේ ප්‍රමුඛ එක්සත් ජනපද සගයා වන ජපානය නොරිඳුවීම සඳහා සිතමතා කල සූත්‍රගත කිරීමකි.

චීනය සමඟ සංහිඳියාවක් සඳහා බ්‍රෙසසින්ස්කි කල කැඳවුම, අවශ්‍යයෙන්ම නව ලෝක යුද්ධයක් මඟහරවා ගැනීමේ අටියෙන් කල එකකි. "දැවැන්ත ව්‍යසනයක අන්තරාය ගැබ්කරගත් 'ශිෂ්ඨාචාරයන්ගේ ගැටුම' නැඟී එන යුගයක් තුලදී, ශිෂ්ඨාචාරයන්ගේ අව්‍යාජ සංහිඳියාවක් දැනුවත්ව වර්ධනය කිරීම දැවෙන අවශ්‍යතාවක් වෙයි."

කෙසේ වුව ද වොෂින්ටන් හමුව, සැලකිය යුතු එකඟතාවන් ඇතිකර ගැනීමට අසමත්වූ තරම්ය. ප්‍රමුඛ බලයන් අතර ආතතීන් සමනය කිරීම කෙසේ වෙතත් ගෝලීය මූල්‍ය අර්බුදය ඒවා උත්සන්න කලේය. චීනය මත මින් පෙර කවර කලෙකවත් නොතිබූ තරම් හීන ආර්ථික බලපෑමක් සහිතව එක්සත් ජනපදයට, අවසාන වශයෙන් සිය ලෝක ආධිපත්‍යය පැටවිය හැක්කේ මිලිටරි අධිකාරයේ මාධ්‍ය තුලින්ම පමනකි. එම ආධිපත්‍යයත්, ප්‍රමුඛ මිලිටරි බලයක් බවට පත්වීමේ ස්වකීයමය වූ චීන අභිලාෂයන් සමඟ සට්ටනයකට මුහුන පායි.

ඔබාමා පරිපාලනය විසින් මාර්තු මාසයේ දී චීන සබ්මැරීන නිරීක්ෂනය කිරීම සඳහා දකුනු චීන මුහුද වෙත පිටත්කර හරින ලද නිරීක්ෂන නෞකාව, චීන නාවික මුර සංචාරක යාත්‍රා සමඟ ගැටුමකට මුල පිරීමක් විය. එම සිද්ධියට යන්තම් දින ගනනකට පෙර *ෆිනෑන්ෂල් ටයිම්ස්* කතුවැකිය අනතුරු ඇඟ වූයේ, ''ලෝකය මුහුන පාන ලොකු ම අභියෝගය චීනයේ නැඟීම සමඟ කටයුතු කිරීමයි. සාපේක්ෂව ස්ථායී ලෝක පර්යායන් නව බලවතුන්ගේ නැඟීම සමඟ ලෙහෙසියෙන් පෑහෙන්නේ නොවේ. ඉතා ශුභවාදී වුවත් වේදනාකාරී බිඳීම් ද, ඉතා අශුභවාදී ව්‍යසනයේ බේදවාචකයන් ද සිදුවේ. මේතාක් දුරට වත්මන් ගෝලීය මූල්‍ය හා ආර්ථික අර්බුදය පාර්ශවීයව උපත ලද්දේ චීනයේ දැවැන්ත වෙලඳ අතිරික්තය, බීජිනය නොඑකඟවන, තුලිනි. එවන් බිඳවැටීම් වල විභව පරිමානය දැනටමත් පැහැදිලි වී තිබේ. රාජ්‍ය තාන්ත්‍රිකයේ හා මිලිටරි බලයේ චීන අභිලාෂය පිලිබඳවත් එයම අදාලවේ."

එක්සත් ජනපද-චීන "සංවාදයේ" සියලු මඳහස හා ඡායාරූප හමු තිබිය දී ම, බලගතු ආර්ථික ප්‍රතිවිරෝධයන් මෙම බලවතුන් දෙදෙනා විභවාත්මක ව්‍යසනකාරී ගැටුම් තුලට තල්ලු කරයි.

© www.wsws.org